# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 13,423—1962 දෙසැම්බර් 7 වැනි සිකුරාද—1962.12.7

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙන ම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිට |
|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන ප්‍රකාශන ආදිය ... | — |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය ... | 1739 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය ... | 1740 |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය | 1740 |
| වෙනත් පත් කිරීම් ආදිය ... ... ... | 1741 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... ... ... | 1742 |
| මිළ පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහා බැංකුවේ දැන්වීම් ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... | 1747 |
| "සුරාබද්ද ආඥාපනත" පිළිබඳ දැන්වීම් ... ... | — |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම් ආදිය

1962 අංක 502

අංකය: ඩී. 201/ආර්ජ්සීපී.

### යුද්ධ හමුදාව—නිත්‍ය භට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීම්

1962 දෙසැම්බර් මස 1 දින සිට කර්නල්වරු වශයෙන් :—

ලුතිනන් කර්නල් රෝයි ඩග්ලස් ජයතිලක, එම්.බී.ඊ., ල.සි.රෙ.
ලුතිනන් කර්නල් දෙන් සේපාල ඇටිගල, එම්.වී.ඕ., ල.ස.ස.බ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඇන්. කජු. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1962 නොවැම්බර් 27 වෙනිදා,
කොළඹ දීය.

12-82

---

1962 අංක 503

ඩී/විඑෆ්ජ්/2/ඒ.

### යුද්ධ හමුදාව—ලංකා ස්වේච්ඡා භට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

1962 ජූලි මස 4 වැනි දින සිට, මේජර් වශයෙන් :—

කපිතාන් අබ්දුල් මජීද් මොහමඩ් නාසික්, ල. පා. ස.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඇන්. කජු. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1962 නොවැම්බර් 22 වෙනිදා,
කොළඹ දීය.

12-1

---

1962 අංක 504

අංකය: ඩී. 378/ඊපී.

### රාජකීය ලංකා නාවික හමුදාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

1961 ජනවාරි 13 වැනි දින සිට තාවකාලික කොමාන්ඩර් හැටියට :—

ලුතිනන්-කොමාන්ඩර් ඒ. එම්. කල්දේරා, රා.ලං.නා.හ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඇන්. කජු. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1962 නොවැම්බර් 29 වෙනිදා,
කොළඹදීය.

12-169/1

---

1962 අංක 505

අංකය: ඩී. 378/ඊපී.

### රාජකීය ලංකා නාවික හමුදාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද පළමු තත්ත්වයට පැමිණවීමක්

1962 මාර්තු 25 වැනි දින සිට, රාජකීය ලංකා නාවික හමුදාවේ පළමු තත්ත්වය වන ලුතිනන් කොමාන්ඩර් පදවියට පැමිණවීම :—

තාවකාලික කොමාන්ඩර් ඒ. එම්. කල්දේරා, රා.ලං.නා.හ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඇන්. කජු. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1962 නොවැම්බර් 29 වෙනිදා,
කොළඹදීය.

12-169/2

## රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය

**1962 අංක 506**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පහත සඳහන් පත්කිරීම් කරන ලෙස නියමකර ඇත්තේ ය:—

ඒ. 57/59.

1962 ජූනි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සිවිල් සේවක ජී. ඇම්. ස්පාර්ක්ස් මහතා මහා භාණ්ඩාගාරයේ අතිරේක ආයතන පාලක වශයෙන් වැඩ බැලීමට.

ඒ. 57/59.

1962 ජූනි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සිවිල් සේවක ඒ. ආර්. ඇම්. ජයවර්ධන මහතා මහා භාණ්ඩාගාරයේ සහකාර සැපයීම් හා සේවක සංඛ්‍යා පාලකයකු වශයෙන් වැඩ බැලීමට.

එන්. පී. විජයරත්න,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1962 දෙසැම්බර් මස 3 වැනි දින,
තැ. පෙ. 500,
කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදීය.

12-235

---

## අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය

**1962 අංක 507**

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම් කර ඇත්තේ ය:—

අංකය: ජේඒ්. 20/48.

එස්. සී. ජයසුන්දර මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1962 නොවැම්බර් 24 වැනි දින සිට, ගම්පහ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 67229/බී දරණ නඩුවේ තීන්දුව දීමට හා ගම්පහ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 73,400/බී, 70,861 සහ 72659/බී දරණ නඩු අවසාන වන තුරු ඇසීමට හා තීන්දු දීමට, ගම්පහ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා ගම්පහ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය: ජේඒ්. 50/48.

එස්. ජෝකනාදන් මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1962 නොවැම්බර් 22 වැනි දින සිට, කිලිනොච්චි මහෙස්ත්‍රාත් උසාවියේ අංක 3,544 දරණ නඩුවේ තීන්දුව දීමට, චාවකච්චේරියේ පිහිටි උසාවියේ ක්‍රියා කරන පිණිස, පේදුරු තුඩුවේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය: ජේඑල්. 7බී/56 (I).

එල්. එච්. ද අල්විස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එම්. එලියතම්බි මහතා 1962 නොවැම්බර් 24 වැනි දින සිට 26 වැනි දින දක්වා, නුවරඑළියේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, නුවරඑළියේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, නුවරඑළියේ, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට, හා බදුල්ලේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය: ජේඑල්. 34ඒ/48.

එස්. එස්. කුලතිලක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, පී. ආසීර්වාදම් මහතා 1962 නොවැම්බර් 28 වැනි දින සිට 30 වැනි වැනි දින දක්වා, රත්නපුරේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට. හා රත්නපුරේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය: ජේඑල්. 1සී/53 (v).

එම්. එම්. අබ්දුල් කාදර් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. සී. කනගසිංහම් මහතා 1962 දෙසැම්බර් 1 වැනි දින සිට 5 වැනි දින දක්වා, ත්‍රිකුණාමලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, ත්‍රිකුණාමලේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, අනුරාධපුරේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට හා අනුරාධපුරේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය: ජේඑල්. 68සී/51.

සී. වී. උදලාගම මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එච්. ඒ. ජයවික්‍රම මහතා 1962 නොවැම්බර් 30 වැනි දින සිට 1962 දෙසැම්බර් 3 වැනි දින දක්වා, අනුරාධපුරේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, අනුරාධපුරේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, මන්නාරමේ හා වවුනියාවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, වවුනියාවේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට, ත්‍රිකුණාමලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට හා ත්‍රිකුණාමලේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය: ජේඑල්. 57ඒ/57.

කේ. ඩී. ඕ. එස්. එම්. සෙනෙවිරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. එම්. අයි. ගුණරත්න මහතා 1962 දෙසැම්බර් 1 වැනි දින සිට 3 වැනි දින දක්වා, ගම්පොල පිහිටි උසාවියේ ක්‍රියා කරන පිණිස, මහනුවර, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට හා ගම්පොල අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය: ජේඑල්. 17ඒ/51 (III).

එන්. එදිරිසිංහ මහතා නැවත වැඩ බාරගන්නා තුරු හෝ නැවත නියමයක් කරන තුරු, එෆ්. ඩබ්ලිව්. ගුණරත්න මහතා 1962 නොවැම්බර් 28 වැනි දින සිට, මීගමුවේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, මීගමුවේ, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට, හා මීගමුවේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය: ජේඑල්. 63ඒ/58.

ජේ. ජී. එල්. සුවාරිස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, පී. ජී. ද සිල්වා මහතා 1962 දෙසැම්බර් 1 වැනි දින සිට 4 වැනි වැනි දින දක්වා, අවිස්සාවේල්ලේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා අවිස්සාවේල්ලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය: පීඑල්/එස්. 7/49.

කේ. සින්නතම්බි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එෆ්. එස්. පෝල් මහතා 1962 දෙසැම්බර් 1 වැනි හා 2 වැනි දිනයන්හි, මන්නාරමේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා මන්නාරමේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය: පීඑල්/එස්. 7/49.

කේ. සින්නතම්බි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එෆ්. එස්. පෝල් මහතා 1962 නොවැම්බර් 28 වැනි හා 29 වැනි දිනයන්හි, මන්නාරම දිස්ත්‍රික්කයේ මන්නාරම ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය: පීඒ්. 37/57.

එම්. එම්. පෙරේරා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. ඩබ්ලිව්. ඒ. ඉමැනුවෙල් මහතා 1962 දෙසැම්බර් 5 වැනි, 6 වැනි, 10 වැනි, 19 වැනි සහ 27 වැනි දිනයන්හි, කුරුණෑගල දිස්ත්‍රික්කයේ දේවමැදි හත්පත්තුවේ ගම්බද උසාවි සභාපති ධුරයේ හා වන්නි හත්පත්තුවේ, කටුගම්පොල හත්පත්තුවේ හා හිරියාල හත්පත්තුවේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

පී. ඒඒ්. 54/57.

සී. එම්. රනතුංග මහතා 1962 දෙසැම්බර් 5 වැනි දින, බටුවත්ත ගම්බද උසාවියේ අංක 1,836 දරණ අපරාධ නඩුව ඇසීමට, කෑගල්ල දිස්ත්‍රික්කයේ ගල්බොඩ, කිනිගොඩ, බෙලිගල් සහ පරනකුරු කෝරලයන්හි ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයට.

අංකය: පීඑල්/එච්. 6/61.

පී. බී. හේරත් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, වී. පී. අබේවික්‍රම මහතා 1962 දෙසැම්බර් 1 වැනි දින, බදුලු දිස්ත්‍රික්කයේ උඩුකිඳ සහ වැල්ලවායේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය: පීඑල්/පී. 6/51.

එස්. ජී. පීරිස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එම්. වික්‍රමතුංග මහතා 1962 නොවැම්බර් 19 වැනි දින හා 1962 දෙසැම්බර් 3 වැනි දිනද, මාතර දිස්ත්‍රික්කයේ මොරවක් කෝරලේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට හ වැලිගම් කෝරළේ හා ගඟබොඩ පත්තුවේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය: පීඑල්/සී. 2/62.

සී. ඒ. එස්. ඊ. ක්‍රිස්පින් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එම්. ඒ. ඊ. බී. පෙරේරා මහතා 1962 දෙසැම්බර් 21 වැනි, 22 වැනි, 24 වැනි හා 26 වැනි දිනයන්හි, කුරුණෑගල දිස්ත්‍රික්කයේ වන්නි හත්පත්තුවේ ගම්බද උසාවි සභාපති ධුරයේ හා හිරියාල හත්පත්තුවේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/වයි. 3/51.

එන්. එම්. යූසුෆ් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඩී. බී. ඩීරෙක්ස් මහතා 1962 දෙසැම්බර් 8 වැනි, 10 වැනි දින සිට 15 වැනි දින දක්වා හා 17 වැනි දින සිට 19 වැනි දින දක්වා කෑගල්ල දිස්ත්‍රික්කයේ, ගල්බොඩ, කිනිගොඩ, බෙලිගල් සහ පරනකූරු කෝරලයන්හි ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/එස්. 6/48.

වී. සෝමසුන්දරම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, පී. වී. සේනාතිරාජා මහතා 1962 දෙසැම්බර් 3 වැනි, 4 වැනි, 5 වැනි හා 7 වැනි දිනයන්හි වවුනියාවේ සහ යාපනේ දිස්ත්‍රික්ක වල උතුරු වවුනියාවේ හා මුහුදුබඩ පත්තු ගම්බද උසාවි සභාපති ධුරයේ හා පූනකාරි-තුන්නුකායි ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

ඇන්. ඒ. ද ඇස්. විජේසේකර,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1962 නොවැම්බර් 29 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්‍යාලය,
තැ. පෙ. අංකය-573,
කොළඹ-12.

12-149.

---

# වෙනත් පත්කිරීම් ආදිය

## 1962 අංක 508

(20 වෙනි පරිච්ඡේදය වන) ක්‍රිමිනල් නඩු විධාන සංග්‍රහයේ 120 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ ඇමතිතුමා විසින්—

අංකය : ඒ. අයි. 12/2/62.

1962, නොවැම්බර් මස 27 වෙනි දින සිට එරුවිල්-පොරතිව් සහ දකුණු මන්මුනෙයි ප්‍රාදේශීය ආදායම් නිලධාරි ධුරය දරන අතර, ස්ථිර පත්කිරීමක් කරනතුරු මඩකලපු දිස්ත්‍රික්කයේ මහිලූර් කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයේ වැඩබැලීමට කේ. මහාදේව මහතා ද,

අංකය : ඒ. අයි. 18/2/62.

1962, නොවැම්බර් මස 30 වෙනි දින සිට රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිටි කෝරලයේ පල්ලේපත්තුවේ හදිසි මරණ පරීක්ෂකවරයකු වශයෙන් ඩී. ටී. පී. මාදෙල මහතාද,

පත්කර ඇත්තේ ය.

ඩී. ජේ. ආර්. ගුණවර්ධන,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩබලන
ස්ථිර ලේකම්.

1962 දෙසැම්බර් මස 3 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේදීය.

12-232

---

## 1962 අංක 509

අංකය : ඒ. ජේ. 25/2/59.

අග්‍රාණ්ඩුකාර උතුමාණන්වහන්සේ ගරු අධිකරණ අමාත්‍යවරයා කෙරෙහි පවරා ඇති බලතල අනුව එතුමා විසින්—

(1) කළුතර අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චය කරුවකු සහ නිලනොලත් මහෙස්ත්‍රාත්වරයෙකුව සිටි ජේ. මලල්ගොඩ මහතා, කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චය කරුවකු වශයෙන් ද,

(2) ලංකා සිවිල් සේවයේ නියුක්ත එස්. වික්‍රමසිංහ මහතා කම්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ කාර්‍යාල සහකාර ධුරය දරණ කාලය තුල කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,

(3) යූ. ඒ. එම්. පියසේන මහතා කෑගල්ල අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,

(4) ආර්. එම්. පී. රත්නායක මහතා මහනුවර අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,

(5) පී. එස්. මොහමඩ් මහතා වව්නියාව අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,

(6) ඩී. ඩබ්ලිව්. ඒ. විමලගුණ මහතා මඩකලපුව අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,

පත්කර ඇත්තේ ය.

ඩී. ජේ. ආර්. ගුණවර්ධන,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩබලන
ස්ථිර ලේකම්.

1962 දෙසැම්බර් මස 3 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේදී ය.

12-234

---

## 1962 අංක 510

ලංකා සිවිල් සේවාවේ පහත සඳහන් පත්වීම් පහත දක්වා ඇති දිනවල පටන් වලංගුවේ :—

අංක : 74/2/117 (ඇම් ඈෆ්).

වී. සී. බී. උනන්තැන්න මහතා, 1962 ඔක්තෝබර් මස 1 වැනි දින සිට අනුරාධපුරය පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත තැනගේ විධානය පිට එකී දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්ත වශයෙන් වැඩ බැලීමට.

අංක : 74/2/210 (ඇම් ඈෆ්).

ඒ. ඕ. වීරසිංහ මහතා, 1962 ඔක්තෝබර් මස 1 වැනි දින සිට කම්කරු සහ ජනසතු සේවා අමාත්‍යාංශයට අනුයුක්තව සිටීමට.

ටී. ධර්මරාජා මහතා 1962 සැප්තැම්බර් මස 17 වැනි දින සිට අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තුවට අනුයුක්තව සිටීමට.

ටී. ධර්මරාජා මහතා, 1962 ඔක්තෝබර් මස 6 වැනි දින සිට වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු පිළිබඳ අමාත්‍යාශයට අනුයුක්තව සිටීමට.

එල්. එල්. ටී. පීරිස් මහතා, 1962 සැප්තැම්බර් මස 21 වැනි දින සිට පොලිස් දෙපාර්තමේන්තුවට අනුයුක්තව සිටීමට.

ඩී. අලුවිහාරේ මහතා, 1962 නොවැම්බර් මස 8 වැනි දින සිට මහා භාණ්ඩාගාරයට අනුයුක්තව සිටීමට.

අංක : 74/48 (ඇම් ඈෆ්).

සිවිල් සේවාවේ ආධුනිකයින් වන, බී. එස්. විජේවීර, එල්. එල්. බී. අයි. ගුණතුංග, ආර්. ජී. ගෝමස් සහ එච්. බී. දිසානායක යන මහතුන් 1962 ඔක්තෝබර් මස 25 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු ආනයන හා අපනයන පාලක දෙපාර්තමේන්තුවට අනුයුක්තව සිටීමට.

සිවිල් සේවා ආධුනික ඩී. ජී. පී. සෙනෙවිරත්න මහතා, 1962 සැප්තැම්බර් මස 1 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු නුවරඑළිය කච්චේරියට අනුයුක්තව සිටීමට.

හ. ෂ. අමරසිංහ,
භාණ්ඩාගාරයේ ලේකම්.

1962 නොවැම්බර් මස 28 වැනි දින,
මුදල් අමාත්‍යාංශය,
කොළඹ.

12-25

---

## 1962 අංක 511

### දැන්වීමයි

ගේටන් ලෙනාර්ඩ් ඇන්තනි ක්ෂේවියර් මෝතා මහතා කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ගරු කම්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු අමාත්‍යතුමා විසින් පත්කර තිබේ.

කම්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 නොවැම්බර් මස 20 වැනි දින,
කොළඹ දී ය.

12-35

# ආණ්ඩුවේ නිවේදන

අංකය : ඩී. 187/රෙක්ට්/7.

## යුද්ධ හමුදා පනත (357 අධිකාරය)

යුද්ධ හමුදා පණතේ (357 අධිකාරය) 3 (2) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ලංකා පාබල හමුදාව (නිත්‍ය) 1962 දෙසැම්බර් 7 වැනි දින සිට යුද්ධ හමුදාවේ බලකායක් බව, අග්‍රාණ්ඩුකාර තැන්පත් විලියම් ගොපල්ලව වන මම මෙයින් නිශ්චය කරමි.

තවද එම දින සිට. ලංකා පාබල හමුදාවේ 1 බලඇනියද, ලංකාසිංහ රෙජිමේන්තුවේ 1 බලඇනියද වෙන වෙනම නිත්‍ය හමුදාවේ බලකායන් වශයෙන් පැවැත්ම නතර විය යුතුයයි නිශ්චය කරමි.

ඩබ්ලිව්. ගොපල්ලව,
අග්‍රාණ්ඩුකාරවරයා.

1962 නොවැම්බර් 29 වැනි දින,
කොළඹ දීය.

12-209/1

---

අංකය : ඩී. 187/රෙක්ට්/7.

## යුද්ධ හමුදාව—නිත්‍ය භට සේනාව

**නිවේදනය**

1962 දෙසැම්බර් 7 වැනි දින සිට පහත සඳහන් සේනාංග, ලංකා පාබල හමුදාවේ (නිත්‍ය) සේනාංග වන බවට මෙයින් දැනුම් දෙමි.

ලංකා පාබල හමුදාවේ 1 බලඇණිය.

ලංකා සිංහ රෙජිමේන්තුවේ 1 බලඇණිය.

ඈන්. කියු. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1962 නොවැම්බර් 29 වැනි දින,
කොළඹ දීය.

12-209/2

---

ඇල්. ඩී.—බී 94/43/පීඇන් 942/ඩී.

## ලංකා විශ්ව විද්‍යාල ආඥාපනත

(186 වෙනි අධිකාරය වන) ලංකා විශ්ව විද්‍යාල ආඥාපනතේ 68(2) වෙනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අග්‍රාණ්ඩුකාර විලියම් ගොපල්ලව වන මම, මෙයට යා කොට ඇති උපලේඛනයේ I වෙනි තීරයෙහි නියමිත ලංකා විශ්ව විද්‍යාලයේ එක් එක් තනතුර, ඒ උපලේඛනයෙහි II වෙනි තීරයේ අනුරූප සටහනෙහි නියමිත තැනැත්තා විසින් දරනු ලබන කල්හි, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවන්හි කාර්‍යයන් සඳහා, රජයේ සේවයෙහි විශ්‍රාම වැටුප් සහිත තනතුරක් වශයෙන් සලකනු ලැබිය යුතු බව මේ නිවේදනයෙන් ප්‍රකාශ කරමි.

ඩබ්ලිව්. ගොපල්ලව,
අග්‍රාණ්ඩුකාරවරයා.

1962 නොවැම්බර් මස 23 වෙනි දින,
කොළඹ දීය.

### උපලේඛනය

| I වෙනි තීරය | II වෙනි තීරය |
|---|---|
| ශල්‍ය වෛද්‍ය විද්‍යාව පිළිබඳ කථිකාචාර්‍ය | දොස්තර ආර්. ඒ. නවරත්න. |
| ව්‍යවච්ඡේද විද්‍යාව පිළිබඳ කථිකාචාර්‍ය | දොස්තර වී. නවරත්නම්. |

12-315

---

ඇල්.ඩී.—බී. 175ඒ/29.

පීඇන් 1 287 (III කාණ්ඩය).

## පාසැල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනත

(432 වෙනි අධිකාරය වන) පාසැල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනත යටතේ 9 වෙනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මුදල් ඇමතිවරයා විසින් පනවනු ලබන නියෝග.

පී. බී. ජී. කළුගල්ල,
මුදල් ඇමති.

1962 නොවැම්බර් 24 වැනි දින,
කොළඹ.

**නියෝග**

1. 1928 පෙබරවාරි 24 වෙනි දින හා අංක 7,631 දරන ගැසට් පත්‍රයෙහි (එහි ලා ව්‍යවස්ථා යනුවෙන් සඳහන් ව) පළ කරනු ලැබ, කලින් කල සංශෝධනය කරනු ලැබූ පාසැල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් නියෝග, එහි 11 වෙනි නියෝගයෙහි ඊට යා කර ඇති උපලේඛනයේ (1) වෙනි ඡේදයෙහි (XI) වෙනි කරුණට ඉක්බිති ව ම, පහත සඳහන් අලුත් කරුණ, එනම් :—

"(XII) 1946 ජූනි 1 වෙනි දිනට පෙර පත් කරනු ලැබූ ජාතික කිරි යෝජනා ක්‍රමය පිළිබඳ (සම්පූර්ණ කාල) දිස්ත්‍රික් පරිපාලකවරු."

ඇතුළත් කිරීමෙන් තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

2. 1 වෙනි නියෝගය මගින් පාසැල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් නියෝගයන්හි කරනු ලැබූ සංශෝධනය 1961 ජනවාරි 1 වෙනි දින සිට ක්‍රියාත්මක විය යුතු අතර එදින පටන් ක්‍රියාත්මක වී ඇතැයි ද සැලකිය යුතු ය.

12-100/1

---

ඇල්.ඩී.—බී. 175ඒ/29.

පීඇන් 1 287 (III කාණ්ඩය).

## විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා

1948 අංක 13 දරන විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා (සංශෝධන) පනතින් සංශෝධනය කරනු ලැබූ පරිදි 1934 පෙබරවාරි 5 වෙනි දින දරන විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවන්හි 51 වෙනි වගන්තිය යටතේ වූ නිවේදනය.

පී. බී. ජී. කළුගල්ල,
මුදල් ඇමති.

1962 නොවැම්බර් 24 වැනි දින,
කොළඹ.

**නිවේදනය**

1. කලින් කල සංශෝධනය කරනු ලැබූ 1934 පෙබරවාරි 5 වෙනි දින දරන විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා, එහි ඇ උපලේඛනයෙහි (19) වෙනි කරුණට ඉක්බිති ව ම පහත සඳහන් අලුත් කරුණ, එනම් :—

"(20) රජයේ ලලිත කලා විද්‍යාලයේ සහකාර කලා කථිකාචාර්‍ය පේශ කර්ම ආචාර්‍යවරු, කලා ආචාර්‍යවරු සහ ගායනය පිළිබඳ සහකාර කථිකාචාර්‍ය.

(21) 1946 ජූනි 1 වෙනි දිනට පෙර පත් කරනු ලැබූ ජාතික කිරි යෝජනා ක්‍රමය පිළිබඳ (සම්පූර්ණ කාල) දිස්ත්‍රික් පරිපාලකවරු."

ඇතුළත් කිරීමෙන් තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

2. මේ නිවේදනයෙහි 1 වෙනි ඡේදය මගින් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවන්හි කරනු ලැබූ සංශෝධනය, ජාතික කිරි යෝජනා ක්‍රමය පිළිබඳ (සම්පූර්ණ කාල) දිස්ත්‍රික් පරිපාලකවරුන්හට ඒ සංශෝධනය අදාළ වන පමණට, 1961 ජනවාරි 1 වෙනි දින සිට ක්‍රියාත්මක විය යුතු අතර එදින පටන් ක්‍රියාත්මක වී ඇතැ යි ද සැලකිය යුතු ය.

12-100/2

ඇල්. ඩී.—බී. 172/36

## ලියා පදිංචි කල ව්‍යාපාර වස්තු හා ඇප පත්‍ර ආඥා පනත

(420 වැනි අධිකාරය වන) ලියා පදිංචි කළ ව්‍යාපාර වස්තු හා ඇප පත්‍ර ආඥා පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාර මා වෙත පැවරී ඇති බලතල අනුව මුදල් ඇමති ඉඩම්පිටියෙ රාල්ලාගේ පුංචි බණ්ඩා ගුණතිලක කලුගල්ල වන මම, 1962 අංක 30 දරන විසර්ජන පනතින් ණය මාර්ගයෙන් ගැනීමට බලය පවරන ලද රුපියල් පණස් කෝටියෙන් මෙහි පහත උප ලේඛනයෙහි නියමිත මුදල, එම උප ලේඛනයේ සඳහන් ක්‍රමය, නියමයන් හා කොන්දේසි අනුව ලංකාව ඇතුළත ණයට ගැනීමට මේ ආඥාවෙන් නියම කරමි.

පී. බී. ජී. කලුගල්ල,
මුදල් ඇමති.

1962 දෙසැම්බර් 3 වැනි දින,
කොළඹ දී ය.

### උප ලේඛනය

1. ණයට ගත යුතු මුදල රුපියල් දෙකෝටියක් විය යුතුය. තවද එය සම මිලට නිකුත් කරන අවුරුදු 21/25 ණය මුදලක් වශයෙන් ලබා ගත යුතුය.

2. ණය මුදල ලියා පදිංචි කළ ව්‍යාපාර වස්තු ඇතිකර, නිකුත් කිරීමෙන් පමණක් ලබා ගත යුතුය.

3. ණය මුදල සඳහා ගෙවිය යුතු පොලිය වර්ෂයකට සියයට 4¾ ක් විය යුතුය.

4. ණය මුදල සඳහා සෑම වර්ෂයකම අර්ධ වාර්ෂික පොලිය ගෙවිය යුතු දිනයන් ජූනි පහළොස් වැනිද හා දෙසැම්බර් පහළොස් වැනිද විය යුතුය.

5. ණය බේරීම සඳහා පිහිටුවන නිදන් අරමුදලට, වර්ෂයකට සියයට 3 මුදලක් ලංකාවේ ඒකාබද්ධ අරමුදලින් අර්ධ වාර්ෂිකව ගෙවිය යුතුය. මේ ගෙවීම් 1963 දෙසැම්බර් පහළොස් වැනිද ආරම්භ විය යුතුය.

6. ණය ලබා ගැනීම සඳහා නිකුත් කරන ලද ලියාපදිංචි කළ ව්‍යාපාර වස්තු සඳහා මුදල් ආපසු ගෙවීමේ දිනය, 1987 දෙසැම්බර් පහළොස් වැනිද විය යුතුය.

එහෙත් 1983 දෙසැම්බර් දහහතර වැනිදට පසු ඕනෑම දිනයක ලියා පදිංචි කළ ව්‍යාපාර වස්තු සම මිලට ආපසු ගෙවීමේ කැමැත්ත රජයට තිබිය යුතුය. මෙසේ මුදල් ආපසු ගෙවීමේ දිනය. මුදල් ඇමතිවරයා විසින් නියම කළහැකි අතර, එම දිනයට හය මාසයකට නොඅඩු කාලයකට පෙර ඒ දිනය ගැසට් පත්‍රයේ හා යටත් පිරිසෙයින් ලංකාවේ පැතිරෙන පුවත් පත් දෙකක දැන්වීම් මාර්ගයෙන් ප්‍රසිද්ධ කළ යුතුය.

## කාර්ය විස්තර පත්‍රිකාව

ව්‍යාපාර වස්තූන් සඳහා මුදල් භාර ගැනීමේ ලැයිස්තුව 1962 දෙසැම්බර් 15 වැනි දින විවෘත කොට 1963 ජනවාරි 16 වැනි දින වසා දමනු ලැබේ
මුළු ණය මුදල ඊට පළමුව ලබා ගතහොත්, එම දිනයෙහිම මුදල් ලැයිස්තුව වසා දමනු ලැබේ

**ලබා ගන්නා ණය ප්‍රමාණය රුපියල් 2,00,00,000 කි**

### ලංකාණ්ඩුවේ සියයට 4¾ ණය මුදල, 1983–87, "ඌ" කාණ්ඩය

**සම මිලට නිකුත් කොට සම මිලට ආපසු ගෙවනු නොලැබේ**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලංකාණ්ඩුව වෙනුවෙන් රුපියල් 2,00,00,000ක ණය මුදලක් ලබාගැනීම සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. එයට ගෙවනු ලබන පොළී ප්‍රමාණය සියයට 4¾කි. ණය මුදල ආපසු ගෙවනු ලබන්නේ 1987 දෙසැම්බර් 15 වැනිදය. නමුත්, හය මාසයක් කලින් දැනුම් දීමෙන් 1983 දෙසැම්බර් 14 වැනිදට පසුව, ඕනෑම දිනයක ණය මුදල ආපසු ගෙවීමට ආණ්ඩුවට ඉඩ තිබේ. ණය ආපසු ගෙවන්නේ ද සම මිලටමය.

**ණය ලබා ගැනීමේ බලය.**—ණය මුදල ලබා ගන්නේ 1962 අංක 30 දරණ විසර්ජන පනතින් ලත් බලයෙන් හා ලියා පදිංචි කළ ව්‍යාපාර වස්තු හා ඇප පත් ආඥා පනතේ (420 වැනි පරිච්ඡෙදය) අඩංගු නීති යටතේය.

**අරමුණ.**—රජය විසින් මේ ණය මුදල ලබාගනුයේ 1962 අංක 30 දරණ විසර්ජන පනතේ 2 (1) (බී) වගන්තිය යටතේ 1962–63 මුදල් වර්ෂයේ සේවාවන් සඳහා වැය කරණු පිණිසය.

**නිකුත් කරන පිළිවෙළ.**—ලියා පදිංචි කළ ව්‍යාපාර වස්තු නිකුත් කිරීමෙන් ණය මුදල ලබා ගනු ලැබේ. (ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය අරමුදල් පිළිබඳ දෙපාර්තමේන්තුවෙන් ලියා පදිංචි කළ ව්‍යාපාර වස්තු පිළිබඳව බලපවත්වන කොන්දේසි අඩංගු පත්‍රිකා ලබා ගත හැකිය).

**ණය කොටසක මිල.**—ණය කොටසක මිල රුපියල් සියයට සියයකි. සම්පූර්ණ මුදල ඉල්ලුම් පත් ඉදිරිපත් කරන විට ගෙවිය යුතුය. අඩුම කොටස රුපියල් සියයකි.

**ඉල්ලුම් පත්.**—ඉල්ලුම් පත් 1962 දෙසැම්බර් 15 වැනිද සිට ණය මුදල් ලබා ගන්නා ලැයිස්තුව පියවනතුරු, රාජ්‍ය ණය රෙජිස්ට්‍රාර් තැන විසින් භාර ගනු ලැබේ. ණයට මුදල් දීමේ ඉල්ලීම් නියමිත ඉල්ලුම් පත්‍රිකාවල එවිය යුතු අතර, ඊට ගෙවිය යුතු මුළු මුදල ඒ සමග එවිය යුතුය. ලංකා මුදල් ඉතිරි කිරීමේ බැංකුවේ හා තැපැල් කන්තෝරු මුදල් ඉතිරි කිරීමේ බැංකුවේ මුදල් තැන්පත් කරන්නන්ට ඒ ආයතන සමග කටයුතු විළියෙළ කොට ඒවා මාර්ගයෙන් ඉල්ලුම් පත් ඉදිරිපත් කළ හැකිය.

බැංකුවලට ද (මුදල් ඉතිරිකිරීමේ බැංකුව හා තැපැල් කන්තෝරු මුදල් ඉතිරිකිරීමේ බැංකුව ඇතුළු) පිළිගත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවන්ට හා අවසර ලත් තැරැව්කරුවන්ටද, ඔවුන්ගේ මුද්‍රාව දරණ ඉල්ලුම් පත් වෙනුවෙන් භාර ගත් නාමික ණය මුදල අනුව සියයට 1/16ක් කොමිස් වශයෙන් දෙනු ලැබේ. හුවමාරු ගාස්තු වශයෙන් නීතිඥවරුන්ට තමන්ගේ මුද්‍රාව දරණ ඉල්ලුම් පත්වල භාරගත් ණය මුදල සම්බන්ධයෙන් ඒ ප්‍රමාණයේම කොමිස් ගෙවනු ලැබේ.

**ව්‍යාපාර වස්තු සඳහා ගෙවීම.**—" ලංකාණ්ඩුවේ ණය අරමුදල " යනුවෙන් හරස් රේඛිත කොට මහ බැංකුව වෙත ගෙවීමට අණ කරන චෙක් පතකින් මුදල් ගෙවිය යුතුය.

**ව්‍යාපාර වස්තු කොටස් සහතික පත්‍ර.**—ඉල්ලුම් පත් ලැබීමෙන් හා පිළිගැනීමෙන් පසු ව්‍යාපාර වස්තු සහතික නිකුත් කරනු ලැබේ.

**පොළිය.**—සෑම වර්ෂයකම අර්ධ වාර්ෂිකව ජූනි 15 වැනිද හා දෙසැම්බර් 15 වැනිද වසකට සියයට 4¾ බැගින් පොළී ගෙවනු ලැබේ. පළමුවෙන් පොළී ගෙවන්නේ 1963 ජූනි 15 වැනිදය. ඒ පොළිය ගෙවනු ලබන්නේ ඉල්ලුම් පත් පිළිගත් දින සිට 1963 ජූනි 14 වැනිද තෙක්, ඒ දිනය ද ඇතුලත් වන කාල සීමාව සඳහාය.

**අයබදු ගැනීම.**—(i) **මුද්දර ගාස්තු**.—ණය නිකුත් කිරීම, පවරා දීම හා ආපසු ගෙවීමාදියේ දී පාවිච්චි කරන සෑම ලියවිල්ලක් ම මුද්දර ගාස්තුවලින් නිදහස් ය.

(ii) ආදායම් බදු.—ලංකාවේ පදිංචි ව්‍යාපාර වස්තු හිමියන්ට ආදායම් බදු අඩු නොකර පොළී ගෙවනු ලැබේ. නමුත්, ආදායම් බද්දට යටත්වන ලංකාවේ පදිංචි ව්‍යාපාර වස්තු හිමියන් ආදායම් බදු සඳහා තමාගේ ආදායම් පෙන්වීමේ දී එම පොළිය ද අඩංගු කළ යුතුය. ලංකාවේ පදිංචි නොවූවන්ට පොළී ගෙවීමට පෙර ආදායම් බදු අඩු කර පොළී ගෙවනු ලැබේ. (දැනට ආදායම් බදු ප්‍රමාණය, ලංකාවේ පදිංචි නොවූ පුද්ගලයන්ගෙන් සියයට 33⅓ක් ද, ධනය ඒකාබද්ධ වූ හින්දු පවුල්වලින් සියයට 39⅜ක් ද, පිට රට ලියා පදිංචි කළ සමාගම්වලින් සියයට 62½ක් ද වෙයි.) ලංකා ආදායම් බද්දෙන් නිදහස් අයට, අය කරනු ලැබූ ආදායම් බදු එම දෙපාර්තමේන්තුවෙන් ආපසු ලබා ගැනීමට අයිතිවාසිකම් තිබේ.

(iii) ධන බද්ද.—1959යේ අංක 14 දරණ පුද්ගලික බදු පනතේ 6 (1) (ඊ) වගන්තිය යටතේ ලංකාණ්ඩුවේ ණය පත්‍ර යොදන මුදල පුද්ගලයෙකුගේ ධනය වශයෙන් සලකනු නො ලැබේ. එබැවින් ඒවා ධන බද්දෙන් නිදහස් ය.

(iv) බූදල් බද්ද.—ලංකාණ්ඩුව විසින් ලංකාව ඇතුළත නිකුත් කරන ලද ව්‍යාපාර වස්තු බූදල් බදු ගෙවීම සඳහා ආණ්ඩුව විසින් භාර ගනු ලැබේ. සම්පූර්ණ මුදල ගෙවූ සම මිලට නිකුත් කොට සම මිලට ආපසු ගෙවන ව්‍යාපාර වස්තූන්ගේ නාමික මිලත්, එයින් රැස්වන පොළියත්, ඒ සමාන බූදල් බද්දක් ගෙවීමට යෙදිය හැක. සම්පූර්ණ මුදල නො ගෙවූ හෝ අඩු මිලට නිකුත් කළ හෝ සම මිලට නොව වෙනයම් මිලකට ආපසු ගෙවන හෝ ව්‍යාපාර වස්තූන් සඳහා රුපියල් සියයේ ව්‍යාපාර වස්තු කොටසකිනුත්, එයින් උපදින පොළියෙනුත් ගෙවිය හැකි බූදල් බදු ප්‍රමාණය වරින් වර ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවේ. නමුත් එවැනි රුපියල් සියයේ ව්‍යාපාර වස්තු කොටසකින් ගෙවිය හැකි බූදල් බදු ප්‍රමාණය, මුලින් ව්‍යාපාර වස්තුව නිකුත් කරන අවස්ථාවේ දී ගෙවූ මුදලත්, ව්‍යාපාර වස්තුව ආපසු ගෙවීමේ දී ගෙවෙන මුදලත් යන දෙක්හි අඩු මුදල යමක් වේ ද, එයට නො අඩු මුදලක් වේ. මුදලින් බූදල් බදු ගෙවීම වෙනුවට ව්‍යාපාර වස්තු මාර්ගයෙන් ගෙවීම් කළ හැක්කේ එම ව්‍යාපාර වස්තූන් මුලින් නිකුත් කරන අවස්ථාවේ දී ම මියගිය තැනැත්තා විසින් මිලයට ගෙන තිබේ නම් හෝ මරණයට වසකට නො අඩු කාලයකට පෙර එම ව්‍යාපාර වස්තූන් මිලයට ගෙන තිබේ නම් හෝ පමණකි.

සුරක්ෂිතතාවය.—ණය මුදල් ලංකාවේ ඒකාබද්ධ අරමුදලෙන් ආරක්ෂා වී ඇත. ණය ගෙවීමේ අරමුදල්හි භාරකරුවන් වන මහ බැංකුවේ මුදල් මණ්ඩලය එහි පාලනය යටතේ ණය මුදල් බේරීම සඳහා වෙන් වූ නිදන් අරමුදලක් පිහිටුවනු ඇත. වර්ෂයකට සියේට 3නේ ප්‍රමාණය අනුව 1963 දෙසැම්බර් 15 වැනිද සිට නිදන් අරමුදලට අර්ධ වාර්ෂික ගෙවීම් පටන් ගනු ලැබේ.

ආණ්ඩුවේ ණය මුදලේ ප්‍රමාණය.—දනට ලංකාණ්ඩුවේ දළ සදතන ණය ප්‍රමාණය රු. 1,89,90,47,100කි. ණය බේරීම සඳහා වෙන් වූ නිදන් අරමුදලෙහි ආසන්න වෙළෙඳ වටිනාකම රු. ɔ6,07,29,7ɔ7කි. එම නිසා ආණ්ඩුවේ ඉතිරි ශුද්ධ ණය මුදල රු. 1,53,83,17,ɔ6ɔකි.

ඉල්ලුම් පත්.—ඉල්ලුම් පත් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවෙන්, වාණිජ බැංකුවලින්, කච්චේරිවලින්, තැපැල් කාර්යාලවලින් හෝ ජාතික මුදල් ඉතිරිකිරීමේ ව්‍යාපාරයේ කොමසාරිස්වරයාගේ කාර්යාලයෙන් ද ලබා ගත හැකිය.

ඕ. බී. ගුණවර්ධන,
රාජ්‍ය ණය රෙජිස්ට්‍රාර් තැන.

රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා මහ බැංකුව,
තැ. පෙ. 1149,
කොළඹ 1,
1962 දෙසැම්බර් 7 වැනි දින දී ය.

12—328

---

අංකය : 4/1/9/ජීසී.

## දේශීය ආදායම් විවේචන මණ්ඩලයට පත්කිරීම්

ගරු මුදල් ඇමතිතුමා විසින් ආදායම් බදු ආඥා පනතේ (242 වැනි පරිච්ඡේදය) 74 (1) වගන්තිය යටතේ 1962 දෙසැම්බර් මස 1 වැනි දින සිට අවුරුදු තුනක කාල පරිච්ඡේදයකට පහත සඳහන් අය විවේචන මණ්ඩලයේ සාමාජිකයින් වශයෙන් පත් කරන ලදී:

1. ඩී. සී. ආර්. ගුණවර්ධන. මහතා.
2. ඇස්. ඇප්. අමරසිංහ මහතා.

හ. පණ්ඩිත ගුණවර්ධන,
මුදල් අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙනුවට.

1962 නොවැම්බර් මස 30, දින
මුදල් අමාත්‍යාංශයේ දී ය.

12-127

---

අංකය : පීඑන්. 137/62 (බී).

පහත සඳහන් සේවය ද්විතීයනය කරන ලද නිලධාරීන්ගේ තාවකාලික වෘත්තීන්හි සේවා කාලය විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවේ 24 වැනි වගන්තියේ කොන්දේසි අනුව, විශ්‍රාම වැටුප් කටයුතු සඳහා ගණන් ගැනීමට අනුමත කරන බව මෙයින් නිවේදනය කරමි :—

| අංකය | නම | විශ්‍රාම වැටුප් සහිත පත්වීම | ද්විතීයනය කළ තනතුර |
|---|---|---|---|
| 1 ... | ජී. සී. පෝල් මහතා | ... විධායක ලිපිකාර පන්තියේ II ශ්‍රෙණියේ ලිපිකරු දුම්රිය ලිපිකාර සේවය | ලංකා දුම්රිය සුභසාධක සමිතියේ ලේකම් හා භාණ්ඩාගාරික |
| 2 ... | එස්. ඩබ්ලිව්. ජිනදස මහතා | ... වෙරළබඩ ෆෝමන් කොළඹ වරාය කොමිෂන් සභාව | බිලොක් අංගන ෆෝමන් කො.ව.කො. සභාව |
| 3 ... | ඩබ්ලිව්. එච්. බී. අබේවර්ධන මහතා | ... I ශ්‍රෙණියේ සුලු පරිපාලක, රජයේ විදුලි දෙපාර්තමේන්තුව | I ශ්‍රෙණියේ සුලු පරිපාලක, රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ජල විදුලි යෝජනා ක්‍රමය |
| 4 ... | ඩබ්ලිව්. ඇෆ්. අයි. ප්‍රනාන්දු මහතා | ... එම | ... එම |
| 5 ... | ජී. සී. ප්‍රනාන්දු මහතා | ... II ශ්‍රෙණියේ සුලු පරිපාලක | ... II ශ්‍රෙණියේ සුලු පරිපාලක, රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ජල විදුලි යෝජනා ක්‍රමය |
| 6 ... | පී. ජී. සේදිරිස් අප්පුහාමි මහතා | ... කාර්යාල කම්කරු, ජන. සං. දෙපාර්තමේන්තුව | ... අර්ධ පුහුණු කම්කරු, I ශ්‍රෙණිය, ජන. සං. දෙපාර්තමේන්තුව |
| 7 ... | එච්. ඩී. ජෙරමියස් මහතා | ... එම | ... එම |

සී. බාලසිංහම්,
වැඩබලන භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්.

මහා භාණ්ඩාගාරය,
1962 නොවැම්බර් 26 දින.

12-9

---

අංකය : ජේ 39/54.

ඇල්.ඩී.—බී. 87/45.

## අධිකරණ ආඥාපනත

(6 වන අධිකාරය වන්) අධිකරණ ආඥාපනතේ 52 වෙනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධිකරණ ඇමති සැමුවෙල් පීටර් ක්‍රිස්ටෝපර් ප්‍රනාන්දු වන මම, බදුල්ල කොට්ඨාශය සඳහා පිහිටුවා ඇති මහෙස්ත්‍රාත් උසාවිය (සුලු අපරාධ අධිකරණය) 1963 ජනවාරි මස 1 වෙනි දින සිට පැවැත්විය හැකි ස්ථානයක් හැටියට ඒ කොට්ඨාශයෙහි මොනරාගල මෙයින් නියම කරමි.

ඇස්. පී. සී. ප්‍රනාන්දු,
අධිකරණ අමාත්‍ය.

1962 නොවැම්බර් මස 21 දින,
කොළඹ දී ය.

12-79

## 1961 අංක 3 දරණ අධිකරණ භාෂා පනත—2 වෙනි වගන්තිය යටතේ ආඥාවයි

1961 අංක 3 දරණ අධිකරණ භාෂා පනතේ 2 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තියෙන් මා වෙත පවරා ඇති බලතල ප්‍රකාර, අධිකරණ අමාත්‍ය සැමුවෙල් පීටර් ක්‍රිස්ටෝපර් ප්‍රනාන්දු වන මම, අගමැතිවරියගේ අදහස් විමසා 1963 ජනවාරි මස පළමුවන දින සිට මෙහි උපලේඛනයෙහි නියමිත එක් එක් ගම්බද අධිකරණයෙහි වාර්තා ගත උත්තරවාද සඳහාත්, නිති කටයුතු වාර්තාගත කිරීම සඳහාත් සිංහල භාවිත කළ යුතුයයි මෙයින් නියම කරමි.

ඇස්. පී. සී. ප්‍රනාන්දු,
අධිකරණ ඇමති.

1962 29. 11 දින,
කොළඹ අධිකරණ අමාත්‍යාංශයේ දීය.

### උපලේඛනය

**ගංගොඩවිල ගම්බද උසාවිය සහ හොන්නන්තර, කඩුවෙල, හන්වැල්ල, අතුරුගිරිය සහ වැල්ලම්පිටිය සංචාරක උසාවි**

(504 සිට 513 දක්වාවූද, 514 සිට 544 දක්වාවූද, ගම්මුලාදෑනීන්ගේ කොට්ඨාශවලින් සමන්විත) කොළඹද (425 සිට 468 දක්වාවූද, 469 සිට 479 දක්වාවූද, 480 සිට 500 දක්වාවූද, 501 සිට 503 දක්වාවූද, ගම්මුලාදෑනීන්ගේ කොට්ඨාශ වලින් සමන්විත) හේවාගම් කෝරළයද (545 සිට 546, 547 සිට 549, 551 හා 562 සිට 603 දක්වාවූද ගම්මුලාදෑනීන්ගේ කොට්ඨාශ වලින් සමන්විත) සල්පිටි කෝරළයද යන ප්‍රාදේශිය ආදායම් නිලධාරීන්ගේ කොට්ඨාශවලින් සමන්විත ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ ගම්බද අධිකරණය.

**වාරියපොළ ගම්බද උසාවිය සහ පලාපත්වෙල, යටවත්ත, රත්තොට, මාගල්ලෑව, ඉළුක්කුඹුර සහ පල්ලේගම සංචාරක උසාවි**

331 ගම්මුලාදෑනි කොට්ඨාශය අත්හැර මාතලේ දකුණද, 399 සිට 409 දක්වාවූ ගම්මුලාදෑනීන්ගේ කොට්ඨාශ අත්හැර මාතලේ නැගෙනහිරද යන ප්‍රාදේශිය ආදායම් නිලධාරීන්ගේ කොට්ඨාශවලින් සමන්විත ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ ගම්බද අධිකරණය.

**බිබිලේ ගම්බද උසාවිය සහ ලුනුගල, මැදගම, මොනරාගල, මාකුල්ල, උරනිය, අළුත්නුවර, මහඔය සහ පදියතලාව සංචාරක උසාවි**

(96 සිට 104 දක්වාවූද, 106 සිට 111 දක්වාවූද, 118 සිට 120 දක්වාවූද, ගම්මුලාදෑනි කොට්ඨාශ වලින් සමන්විත) වෙල්ලස්ස කොට්ඨාශය, (112 සිට 117 දක්වාවූද, 121 සිට 130 දක්වාවූද, ගම්මුලාදෑනි කොට්ඨාශ වලින් සමන්විත) මොනරාගල කොට්ඨාශය, (91 සිට 95 දක්වාවූද, ගම්මුලාදෑනි කොට්ඨාශවලින් සමන්විත) යටිකිඳ කොට්ඨාශය, (140, 142, 143, 145, හා 146 දරණ ගම්මුලාදෑනි කොට්ඨාශ වලින් සමන්විත) වැල්ලවාය කොට්ඨාශය (1 සිට 15 දක්වාවූද, ගම්මුලාදෑනි කොට්ඨාශවලින් සමන්විත) බින්තැන්න කොට්ඨාශය, (136, 137, 137අ, 138 සිට 142 දක්වාවූද, 144 සිට 146 දක්වාවූද ගම්මුලාදෑනි කොට්ඨාශවලින් සමන්විත) බින්තැන්න පත්තුව යන ප්‍රාදේශිය ආදායම් නිලධාරීන්ගේ කොට්ඨාශ වලින් සමන්විත ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ ගම්බද අධිකරණය.

**කහටගස්දිගිලිය ගම්බද උසාවිය සහ කැබිලිතිගොල්ලෑව, හොරොව්පතාන, යකල්ල, මරදන්කඩවල සහ තිරප්පනේ සංචාරක උසාවි**

(26, 26අ, 27 27අ, 27ආ, 28, 29. 29අ, 29ආ, 30, 31, 31අ, 32 සිට 37 දක්වා හා 37අ දක්වාවූද ගම්මුලාදෑනීන්ගේ කොට්ඨාශ වලින් සමන්විත) නුරුළු පළාත උතුර (38, 39, 39අ, 40, 40අ, 41, 41අ, 41ආ, 42, 42අ, 42ආ, 43, 43අ, 43ආ, 44, 44අ හා 45 දක්වාවූද ගම්මුලාදෑනීන්ගේ කොට්ඨාශවලින් සමන්විත) නුරුළු පළාත දකුණ (59 සිට 61 දක්වාවූද ගම්මුලාදෑනීන්ගේ කොට්ඨාශවලින් සමන්විත) කලගම් පළාතද යන ප්‍රදේශිය ආදායම් නිලධාරීන්ගේ කොට්ඨාශ වලින් සමන්විත ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ ගම්බද අධිකරණය.

**බ්ලැක්පූල් ගම්බද උසාවිය සහ පුන්ඩලුඔය, තලවකැලේ මාස්වෙල සහ නිල්දන්ඩහින්න සංචාරක උසාවි**

(456 සිට 465ආ දක්වාවූද, 466 සිට 470 දක්වාවූද 471අ සිට 474 හා 475 සිට 475ආ දක්වාවූද, ගම්මුලාදෑනීන්ගේ කොට්ඨාශවලින් සමන්විත) කොත්මලේද (476 සිට 478 හා 513 සිට 535 දක්වාවූද, ගම්මුලාදෑනීන්ගේ කොට්ඨාශවලින් සමන්විත) වලපනේද, යන ප්‍රාදේශිය ආදායම් නිලධාරීන්ගේ කොට්ඨාශවලින් සමන්විත ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ ගම්බද අධිකරණය.

**මාවනැල්ල ගම්බද උසාවි සහ මාවතගොඩ, පින්නවල, හෙට්ටිමුල්ල, බටුවත්ත, සහ ඇදිගම සංචාරක උසාවි**

(1 සිට 14අ දක්වාවූද, 15 සිට 33 දක්වාවූද, ගම්මුලාදෑනි කොට්ඨාශ වලින් සමන්විත) ගල්බොඩ සහ කිනිගොඩ කෝරළයද (34 සිට 47අ දක්වාවූද, 48 සිට 59 දක්වාවූද, ගම්මුලාදෑනි කොට්ඨාශ වලින් සමන්විත) පරණකුරු කෝරළයද, (60 සිට 65 හා 68 දක්වාවූද ගම්මුලාදෑනි කොට්ඨාශ අත්හැර) බෙලිගල් කෝරළයද යන ප්‍රාදේශිය ආදායම් නිලධාරීන්ගේ කොට්ඨාශ වලින් සමන්විත ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ ගම්බද අධිකරණය.

12-233

---

## බෞද්ධ විහාර දේවාල ගම් ආඥාපනත

### (318 වෙනි පරිච්ඡේදය)

1946 දරණ ලංකාණ්ඩුක්‍රම පණතේ 38 (1) වගන්තිය යටතේ 1947 සැප්තැම්බර 18 දින දරණ සංශෝධිත ප්‍රකාශනය අනුව, බෞද්ධ විහාර දේවාලගම් ආඥාපණතේ 6 (1) වගන්තිය යටතේ පහත සඳහන් මහත්වරුන් ඉහත සඳහන් ආඥාපණතේ 5 වෙනි වගන්තියේ සඳහන් උපදේශක සභාවේ සාමාජික මහතුන් වශයෙන් මෙදින සිට පස් අවුරුද්දකට නොවැඩි කාලයක් සඳහා පත් කිරීමට ගරු කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමතිතුමා සතුට ප්‍රකාශ කර තිබෙන බව දැන ගැනීම සඳහා මෙසේ ප්‍රසිද්ධ කරමි.

1. උපාලි දියෙස්
2. පාලිත වීරමන්

ඩබ්ලිව්. බී. එම්. සෙනෙවිරත්න,
කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 නොවැම්බර් මස 28 වනදා,
කොළඹ දී.

12-2

---

### ප්‍රතිසංවිධානය කළ කෘෂිකර්ම මධ්‍ය මණ්ඩලය

අංක 7,778 හා 1947 සැප්තැම්බර් මස 24 වැනි දින දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළවූ ප්‍රකාශනයෙන් මදක් වෙනස් කරණ ලද කෘෂිකර්ම දෙපාර්තමේන්තු ආඥා පණතේ (304 ශීර්ෂ පාඨය) 4 වැනි වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව තමන් විසින් සංස්ථාපිත කෘෂිකර්ම මධ්‍ය මණ්ඩලයට කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් පහත සඳහන් නාම යෝජනාවක් කර ඇති බව අංක. 13,230 හා 1962 ජුලි මස 27 වැනි දින දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළවූ නිවේදනයට වැඩිමනත් වශයෙන් මෙයින් දැනුම් දෙනු ලැබේ. 1962 ජුලි මස 27 වැනි දින දරණ නිවේදනයේ "නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (පරිපාලන)" යන්නට ඉදිරියෙන් වූ "48" දරණ අනුක්‍රමික අංකය "54" යනුවෙන් සංශෝධනය විය යුතුය.

#### පාලන දිස්ත්‍රික්කවල නියෝජිතයෝ

26. වී. ආර්. නවරත්නරාජා මහතා—ත්‍රිකුණාමලය
27. එස්. බී. ලේනව මහතා—අනුරාධපුරය
28. ටී. මුරුගේෂ පිල්ලෙයි මහතා—වව්නියාව
29. ආර්. එස්. රාමනායක මහතා—මහනුවර
30. ඩබ්ලිව්. ආර්. පී. බී. මැණික්දිවෙල මහතා—මොණරාගල
31. ඒ. පී. දිවිතොටවෙල මහතා—බදුල්ල
32. එස්. ඒ. අයි. ඇල්පාත මහතා—රත්නපුරය
33. ලෙස්ලි ගුණවර්ධන මහතා—කළුතර
34. විලියම් නිල් ද අල්විස් මහතා—ගාල්ල
35. පර්සි ඒ. වික්‍රමසිංහ මහතා—මාතර
36. ජෝර්ජ් රාජපක්ෂ මහතා—හම්බන්තොට

#### පත්කළ සාමාජිකයෝ

48. සෙනෙට් මන්ත්‍රී තෝමස් අමරසූරිය මහතා
49. උපාලි දියෙස් මහතා
50. එන්. එස්. ද එස්. වික්‍රමසිංහ මහතා
51. ඒ. එස්. වටුර් මහතා
52. විල්මට් ඒ. පෙරේරා මහතා
53. ඩයමන්ඩ් ද සිල්වා මහතා

ස්ථාවර ලේකම්:
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල අමාත්‍යාංශය.

1962 නොවැම්බර් මස 23 වැනි දින,
කොළඹ, මහ ලේකම් කාර්යාලයේ,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල අමාත්‍යාංශයේ දී ය.

12-128

## සින්නපාඩු ධීවර ආරාවුල

යථෝක්ත ධීවර ආරාවුල පිළිබඳ ප්‍රසිද්ධ විභාගය පැවැත්වූ සිරිල් වැන් ලැන් ගන් බර්ග් මහතාගේ වාර්තාව 1962 දෙසැම්බර් මස 19 වැනි දින පෙ. ව. 10 ට බත්තුළුඹය සංචාරක බංගලාවේදී කියවනු ලබන බව ආරාවුලට සම්බන්ධ පක්ෂ හා ඒ සම්බන්ධව උනන්දුවක් දක්වන අතිකුත් අය වෙතත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
ධීවර අධ්‍යක්ෂ.

1962 නොවැම්බර් මස 29 වැනි දින,
කොළඹ 3,
ධීවර දෙපාර්තමේන්තුවේදීය.

12-165

---

## 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

### 49 ඡේදය යටතේ සහතිකය

පළාත් පාලන හා නිවාස කටයුතු ඇමතිවර, මහානාම සමරවීර වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡේදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡේදයෙහි අදහසට ඇතුළත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

මහානාම සමරවීර,
පළාත් පාලන හා නිවාස ඇමතිතුමා.

1962 නොවැම්බර් මස 28 වෙනි දින,
කොළඹ 2 දීය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, බොරැල්ල ගම්මුලාදැනි වසමේ පිහිටි කාසල් වීදියේ වරිපනම් අංක 75, 77 සහ 85 දරණ ඉඩමෙන් පහත සඳහන් පරිදි මායිම් ඇති අක්කරයක පමණ ප්‍රමාණයක ඉඩම් කොටසක් :—

උතුරට : බාවා පෙදෙස, වරිපනම් අංක 15 දරණ ඉඩම් ; නැගෙනහිරට : කාසල් වීදියේ වරිපනම් අංක 89 සහ ෂෙඩ් ග්‍රේව් ඇවනියු හි වරිපනම් අංක 26/1 සහ 26/2 දරණ ඉඩම් ; දකුණට : කාසල් වීදිය ; බස්නාහිරට : වරිපනම් අංක 71, 73 සහ 77 දරණ ඉඩම්.

12-126

---

## 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ සභා ආඥාව

### අංක 57 — බෙන්තර- ඇල්පිටිය මැතිවරණ කොට්ඨාශය

පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් ගම් සභා ආඥපනතේ 11 වන කොටසේ (දැනට 8 වෙනි කොටස) (පරිච්ඡේද 257) යටතේ 1961 කේ අගෝස්තු මස 25 වෙනි දින අංක 12, 167 දරණ ගැසට් පත්‍රයේ ප්‍රසිධ කරන්ට යෙදුන නියෝගය අනුව ඉහත සඳහන් මැතිවරණ දිස්ත්‍රික්කයේ "ජේ" අක්ෂරය දරණ ඡන්ද කොට්ඨාශය වෙනුවෙන් 1961 කේ ජුලි 3 වෙනි දින අංක 12, 503 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) පිළිබඳ රාජසභා ආඥාවේ 10 (3) කොටස යටතේ ප්‍රසිද්ධ කරන්ට යෙදුන දැන්වීමෙ උපලේඛනයේ සඳහන් විස්තර වෙනුවට පහත සඳහන් උපලේඛනයේ සඳහන් විස්තර යෙදිය යුතුබව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඒ. ඇස්. නවරත්නරාජා,
ලියා පදිංචි කිරීමේ නිලධාරි තැන.

1962 නොවැම්බර් මස 23, ගාල්ල.

### උපලේඛනය

| ඡන්ද කොට්ඨාශය | අක්ෂරය හෝ අක්ෂර | ඡන්ද විමසන ස්ථානය හෝ ස්ථාන පිහිටුවන ලබන ප්‍රදේශය |
|---|---|---|
| බෙන්තොට වලල්ලාවිට කෝරලේ (බටහිර) අංක. 40—ඌරගහ ගම්මුලාදැණි වසම තුල පිහිටි, ඌර ගස්මන්හන්දිය ගම් සභාවේ කුඩා ඌරගහ ගම් ඇතුලත් කොට්ඨාශ අංක. 8—කුඩා ඌරගහ (සහ) | | |
| බෙන්තොට වලල්ලාවිට කෝරලේ (බටහිර) අංක. 40—ඌරගහ ගම්මුලාදැණි වසමතුල පිහිටි ඌරගස් මන්හන්දිය ගම් සභාවේ හිපන්වත්ත සහ මහ-ඌරගහ යන ගම් වලින් යුක්තවූ කොට්ඨාශ අංක, 9 මහ-ඌරගහ. | "ජේ" | මහ-ඌරගහ" |

12-33

---

## නිවැරදි කිරීම

61.7.3 වැනි දින අංක 12,503 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් නිවේදනයෙහි, 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ පිළිබඳ) රාජ සභා නියෝගයේ 10 (3) වැනි වගන්තිය යටතේ ප්‍රසිඛ කරණ ලද දැන්වීමේ ඇති දෝෂයන් නිර්දෝෂකර ඇති හෙයින් එය පහත දක්වෙන නිර්දෝෂ කිරීම් අනුව කියවේ :

(ඒ) අංක 36 දරණ රත්තොට මැතිවරණ දිස්ත්‍රික්කයේ "ඉසඩ්" අක්ෂරය දරණ ඡන්දදායක දිස්ත්‍රික්කයේ විස්තරවන "බඹරගල වත්ත සහ හල්ගොල්ල වතුයාය" කපාහැර ඒ වෙනුවට "සන්දනම් වත්ත හැර හල්ගොල්ල වතුයායේ කොටසක්, දික්කුඹුර වත්තෙන් කොටසක් (බෙල්ලාවල කොටස හැර) සහ වනරාජි වත්ත ඇතුලත් විය යුතුය. "මඩකුඹුර" ගමට පසුව නිකොලොය වත්ත සහ බඹරගල වත්ත ඇතුලත්විය යුතුය. "වෙරළුගස්තැන්න" ගමට පසුව මිඩ්ලන්ඩ් වත්ත සහ රේල්ස්ටන් වත්තද, කොල දැව්විය වත්තෙන් කොටසක්, දික්කුඹුර වත්තෙන් කොටසක් (බෙල්ලාවල කොටස ඇතුලත්වූ) සහ හල්ගොල්ල වතුයායේ කොටසක් නොහොත් සන්දනම් වත්ත ඇතුලත් විය යුතුවේ.

(බී) අංක 36 දරණ රත්තොට මැතිවරණ දිස්ත්‍රික්කයේ "බීබී" අක්ෂර දරණ ඡන්දදායක දිස්ත්‍රික්කයේ කොලදාව්විය යන වචනයට පසුව "(කොටසක්)" යනුවෙන් ඇතුලත් විය යුතුය.

එල්. යූ. සී. කුරුප්පු,
අංක 36 දරණ මැතිවරණ දිස්ත්‍රික්කයේ
සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරිතැන.

1962 නොවැම්බර් මස 23 වැනි දින,
මාතලේ කච්චේරියේදීය.

12-11

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## පුත්තලම් පාලන දිස්ත්‍රික්කයේ 1963 වර්ෂයට තුවක්කු බලපත්‍ර අළුත්කිරීම

පුත්තලම් පාලන දිස්ත්‍රික්කයේ තුවක්කු බලපත්‍ර 1963 වර්ෂය සඳහා අළුත්කිරීම 1962.12.1 වැනි දින සිට ඒ ඒ කොට්ඨාශවල ප්‍රාදේශීය ආදායම් නිලධාරීන් විසින් කරගෙන යනු ලැබේ. එසේ හෙයින් මේ සම්බන්ධ සියළුම ඉල්ලුම් පත්‍ර ඒ ඒ ප්‍රාදේශීය ආදායම් නිලධාරීන් වෙත යැවිය යුතුය. තමන්ගේ තුවක්කු බලපත්‍ර 1962 දෙසැම්බර් මස 31 වැනි දින හෝ ඊට කලින් අළුත්කරවා ගන්නා ලෙස මහජනයාට මෙයින් දැනුම් දෙනු ලැබේ. 1963 වර්ෂයට බලපත්‍ර නිකුත් කිරීමට ප්‍රථම 1962 වර්ෂයේ බලපත්‍රයත් ඊට අයත් තුවක්කුවත්, බලපත්‍ර අලුත්කරන නිලධාරි තැනගේ පරීක්ෂණය සඳහා ඉදිරිපත් කළ යුතුය. ඉහත සඳහන් දිනෙන් පසු බලපත්‍ර අළුත්කරවා ගන්නා අයවලුන් බලපත්‍ර ගාස්තුවට සමාන දඩ මුදලක්ද ගෙවිය යුතු බවද මෙයින් දැනුම් දෙමි.

2. යම් තුවක්කු බලපත්‍රයක් 1963 වර්ෂයට අළුත් නොකිරීමට බලාපොරොත්තු වේ නම් එකී බලපත්‍රය හා ඊට අයිති තුවක්කුවද බලපත්‍ර අළුත්කරන නිලධාරි තැනට හෝ මෙම කාර්යාලයට 1962 දෙසැම්බර් මස 31 වැනි දින හෝ ඊට කලින් භාර දිය යුතුය.

3. 1963 මාර්තු මස 31 වැනි දින හෝ ඊට පළමු අළුත්කරවා නොගත් සෑම බලපත්‍රයක් වෙනුවෙන්ම නඩු පවරන බව මෙයින් දැනුම් දෙමි.

වී. රාමනාදන්,
පුත්තලමේ දිසාපති.

1962 නොවැම්බර් මස 30 වැනි දින,
පුත්තලමේ දිසාපති කාර්යලයේදීය.

12-166

---

## අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලය විසින් පාඨශාලා භාවිතය පිණිස අනුමත කරන ලද පාසල් පන්ති පොත්වල සම්පූර්ණ ලේඛනය

අංක 13,399 හා 62.11.23 වැනි දින දරණ ගැසට් නිවේදනයෙහි පළවූ පන්ති පොත්වල සම්පූර්ණ ලේඛනයට පහත සඳහන් පොත් ද ඇතුළත් විය යුතුය.

**කියවීම**

අනුමතියේ වලංගු කාලය—63.1.1 සිට 67.12.31 දක්වා.

| පොතේ නම | කර්තෘ | පංතිය | ප්‍රකාශක |
|---|---|---|---|
| සියබස් මහ (සංශෝධිත සංස්කරණය) ... | කේ. අයි. කරුණාරත්න<br>කේ. ඩී. කරුණාරත්න ... | ඉ. බා.—6 ... | මහාබෝධි මුද්‍රණාලයය |

බර්ටි ජයසූරිය,
අ. ග්‍ර. ප්‍ර. උ. ම. ලේකම්.

1962ක්වූ දෙසැම්බර් මස 1 වෙනි දින,
කොළඹ 2, මලයි වීදියේ,
අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලයේ දී ය.

12–121

---

## අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලය විසින් පාඨශාලා භාවිතය පිණිස අනුමත කරන ලද පාසල් පන්ති පොත්වල සම්පූර්ණ ලේඛනය

අංක 13,399 හා 62.11.23 වැනි දින දරණ ගැසට් නිවේදනයෙහි පළවූ පන්ති පොත්වල සම්පූර්ණ ලේඛනයට පහත සඳහන් පොත් ද ඇතුළත් විය යුතුය.

**කියවීම**

අනුමතිය වලංගු කාලය—63.1.1 සිට 64.12.31 දක්වා

| පොතේ නම | කර්තෘ | පන්තිය | ප්‍රකාශක |
|---|---|---|---|
| පරාක්‍රමගේ කියවීම් පොත ... | පී. ද ඇස්. කුලරත්න ... | ඉ. බා. ... | සීමාසහිත ස්වභාෂා ප්‍රකාශකයෝ |

**අංක ගණිතය**

අනුමතිය වලංගු කාලය—60.1.1. සිට 64. 12. 31 දක්වා

| පොතේ නම | කර්තෘ | පන්තිය | ප්‍රකාශක |
|---|---|---|---|
| රත්න ගණිතය ... | පී. ද. ඇස්. කුලරත්න ... | 8 ... | සීමාසහිත ස්වභාෂා ප්‍රකාශකයෝ |

බර්ටි ජයසූරිය,
ලේකම්,
අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලය.

1962 ක්වූ නොවැම්බර් මස 30 වෙනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලයේදීය.

12–123

---

## අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලය විසින් පාඨශාලා භාවිතය පිණිස අනුමත කරන ලද පන්ති පොත්වල සම්පූර්ණ ලේඛනය

අංක 13,399 හා 62.11.23 වැනි දින දරණ ගැසට් නිවේදනයේ පෙර වදනෙහි 4 වැනි ඡේදය අවසනට පහත සඳහන් වැකිය එක්විය යුතුය :—

" පැරණි සාහිත්‍ය කෘතීන්ගේ නව සංස්කරණ, ගැටපද, සන්න, විවරණ හා ශබ්දකෝෂ, බිම් සිතියම් පොත්, ප්‍රස්තාර යන පොත් මේ මණ්ඩලය විසින්, නිර්දේශ කරනු නොලැබේ. එබැවින් මේ කෘතීන්ගෙන් සුදුස්සක් තම පාසලට නියම කිරීමට පාඨශාලා ප්‍රධානයනට අවසර ඇත."

බර්ටි ජයසූරිය,
අ. ග්‍ර. ප්‍ර. උ. ම. ලේකම්.

1962 ක්වූ දෙසැම්බර් මස 3 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ
අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලයේදීය.

12-171

## අනුරාධපුර හා වවුනියා සමුපකාර කොට්ඨාශ

1962 නොවැම්බර් 9 වෙනි දින හා අංක 13,387 දරන ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ ආකාරයට අනුරාධපුර සමුපකාර කොට්ඨශය නැවත බෙදා වෙන් කිරීම අවලංගු කරනලද බැව් මෙයින් දන්වනු ලැබේ.

අනුරාධපුර හා වවුනියා සමුපකාර කොට්ඨාශ මින් මතු පහත සඳහන් පරිදි වන්නේ ය :—

**අනුරාධපුර උතුර**

නුවරගම් පළාත නැගෙනහිර

හුරුළු පළාත උතුර

උඩියන් කුළම කෝරළේ

**අනුරාධපුර දකුණ**

නුවරගම් පළාත බටහිර

කලාගම් පළාත

හුරුළු පළාත දකුණ

**වවුනියාව**

වවුනියාව දකුණ (දෙමළ)

වවුනියාව දකුණ (සිංහල)

වවුනියාව උතුර

මුහුදුබඩ පත්තු

වී. ඊ. ගුණරත්න,
සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර
සමිති රෙජිස්ත්‍රාර් තැන.

1962 නොවැම්බර් 26,
කොළඹ, සමුපකාර දෙපාර්තමේන්තුව.

12-104

---

රෝ. ආ. 40 අ.

## 1938 අංක 51 දරණ සමාගම් ආඥාපනත

**277 (5) වගන්තිය යටතේ සීමාසහිත ඔස්ට්‍රියා සිලෝන් ට්රේඩිං සමාගමේ නම කපා හැරීමේ දැන්වීම**

1938 අංක 51 දරණ සමාගම් ආඥාපනතේ විධිවිධාන යටතේ 1953 අප්‍රේල් මස 23 වැනි දින සංස්ථාපිත සමාගමක් වන සීමාසහිත ඔස්ට්‍රියා සිලෝන් ට්රේඩිං සමාගම ව්‍යාපාරික කටයුතුවල නිරත වී නැති බව, නොහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින් ද,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, එ දින සිට තුන් මාසයක් ඉකුත් වූ විට, සීමාසහිත ඔස්ට්‍රියා සිලෝන් ට්රේඩිං සමාගමේ නම රෙජිස්ටරයෙන් කපා හරින බවට 1962 අගෝස්තු 24 වැනි දින අංක 13,272 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙන්, 1962 අගෝස්තු 16 වැනි දින දරණ දැන්වීමක් පළ කරන ලද හෙයින් ද,

සීමාසහිත ඔස්ට්‍රියා සිලෝන් ට්රේඩිං සමාගම ඉහත කී තුන් මාසයේ කාල සීමාව තුළ එසේ නොකිරීමට හේතු දක්වා නොමැති බැවින් ද,

අද දින, සීමාසහිත ඔස්ට්‍රියා සිලෝන් ට්රේඩිං සමාගමේ නම සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින ලද බව ද, ඉහත කී සමාගම විසුරුවා හරින ලද බව ද, සමාගම් රෙජිස්ට්‍රාර් තැන්පත් වෝල්ටර් මහේස සෙල්ලයියා වන මම, 1938 අංක 51 දරණ සමාගම් ආඥාපනතේ 277 (5) වැනි වගන්තිය යටතේ මෙම දැන්වීමෙන් ප්‍රකාශ කරමි.

ඩබ්ලිව්. ඇම්. සෙල්ලයියා,
සමාගම් රෙජිස්ට්‍රාර්.

1962 නොවැම්බර් මස 23 වැනි දින,
කොළඹ 1, සමාගම් රෙජිස්ත්‍රාර්ගේ දෙපාර්තමේන්තුවේදීය.

12-43

---

## කැලෑ දෙපාර්තමේන්තුව

**ආහාර බෝග නිපදවීමට උදව්දීම සඳහා සමුපකාර ක්‍රමයට නැවත වන වගා කිරීමේ ව්‍යාපාරය**

1962 දෙසැම්බර් 15 වන දින දක්වා වයඹ දිසාවේ කැලෑ නිලධාරි තැන විසින් සමුපකාර ක්‍රමයට නැවත වන වගා කිරීමට කුරුණෑගල හා මැල්සිරිපුර යන කොට්ඨාශයන්හි ගල්කැටියාගම හා පල්ලේ කැලේ යන ප්‍රදේශවල ඉඩම් බෙදා දීම සඳහා ඉල්ලුම් පත්‍ර භාර ගනු ලැබේ. ආහාර බෝග වගාකිරීමට කැමති පුද්ගලයන්ට හා ලියාපදිංචි කළ සමිති සමාගම්වලට මෙම ව්‍යාපාරය යටතේ ඉඩම් ඉල්ලිය හැක. මෙම ව්‍යාපාරයට අදාල, කොන්දේසි හා විස්තර කුරුණෑගල කොට්ඨාශ කැලෑ නිලධාරීන්ගෙන් හෝ කුරුණෑගල දිසා කැලෑ නිලධාරීන්ගෙන් හෝ ලබාගත හැක.

ස. මුත්තයියා,
වයඹ දිසා භාර කැලෑ නිලධාරී.

1962 නොවැම්බර් මස 22 වැනි දින,
කුරුණෑගල.

12-1464

---

## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

**ආහාර වගා කිරීමේ ව්‍යාපාරයට සහායවීමට**

**සමුපකාර නැවත වන වගා කිරීමේ යෝජනා ක්‍රමය**

ඉහත දක්වන යෝජනා ක්‍රමයට සහභාගිවීම සඳහා ලියා පදිංචි කළ සමිතිවලින් හෝ පුද්ගලයින්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. වගා කරන ලද ප්‍රදේශවල ආහාර බෝග වගා කිරීමේ අයිතියත් සමග තේක්ක හා බුරුල් දුව වර්ග වගා කිරීම පිණිස තුන් අවුරුදු කාලයකට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඉඩම් බෙදා දෙනු ඇත.

2. ඒවා පිහිටි ප්‍රදේශ හා දිශා පහත දක්වනු ලැබේ. වගා කිරීම පිණිස භාර ගැනීමට අදහස් කරන ප්‍රමාණයන්ද සඳහන් කරමින් පිළියෙල කළ ඉල්ලුම්පත් ඒ ඒ දිශා වන නිලධාරින් වෙත 63.1.12 දිනට පෙර ඔවුන් වෙත ළඟා වෙන ලෙස යැවිය යුතුය. වැඩිදුර විස්තර හා යෝජනා ක්‍රමය පාලනය කෙරෙන කොන්දේසි ඉහත සඳහන් දිශා වන නිලධාරීන්ගෙන් ලබාගත හැකිය.

| ප්‍රදේශය | ලබාගත හැකි අක්කර ප්‍රමාණය (දළවශයෙන්) | දිශාව |
|---|---|---|
| කරුන්කාලිකුලම් හා නාගචෝලයි | අක්කර 200 | වවුනියා |
| ඔමුණුගල, නුවරගම් හා කෝරාලයි රක්ෂිත වන හා කරාමුනෙයි රජයේ අවශේෂ වනාන්තරය | අක්කර 750 | නැගෙනහිර |
| වන්නියාගම | අක්කර 150 | වයඹ |
| වීල්පොත | අක්කර 250 | එම |
| කදුරුවැව | අක්කර 50 | එම |
| ඉනාමළුව | අක්කර 100 | එම |
| මීරිගම | අක්කර 200 | එම |
| තෝනිගල | අක්කර 100 | එම |
| සෙල්ලකන්දල් | අක්කර 200 | එම |
| වැලිකුඹුර | අක්කර 90 | එම |
| ගැටදිවුල | අක්කර 50 | එම |
| රත්කරාව | අක්කර 200 | බටහිර |
| තනමල්විල | අක්කර 500 | දකුණු |
| තිස්ස-කතරගම | අක්කර 500 | එම |
| උස්වැව | අක්කර 100 | එම |
| බිබිලේ | අක්කර 100 | උඩරට |
| නාමන්ඩිය | අක්කර 150 | එම |
| හුරුළු | අක්කර 100 | උතුරු මැද |
| ගල්ඔය යෝජිත රක්ෂිත වනය | අක්කර 200 | එම |
| නුවරගම් රක්ෂිත වනය | අක්කර 100 | එම |

ජේ. ඇල්. ඊ. ප්‍රනාන්දු,
වැඩ බලන වන සංරක්ෂක.

12-213

---

## දැන්වීමයි

බටහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ අළුත්කුරු කෝරළේ උතුර සහ උතුර බී කරවන ආදායම් පාලක නිළධාරි කොට්ඨාශවල දූනගහ, කන්දේවෙල සහ පල්ලියපිටිය ගම්පති කොට්ඨාශවල ගවයින් අතර, "මුව සහ කුර" නමැති රෝගය පැතිරී යන බැව් 1957තේ අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥා පනතේ 327 පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ (1) අතුරු වගන්තිය යටතේ මා විසින් වෂී 1962.8.24 දින අංක 13,272 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිඹ කරන ලද දැන්වීම අද දින සිට අවලංගු වන බව මහජනයාට මෙයින් දැනුම් දෙමි.

අබේරත්න බණ්ඩාරනායක,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිළධාරී.

1962 නොවැම්බර් 26 වැනි දින,
පේරාදෙණියේ, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය කායසීලයේදීය.

12-19

## ප්‍රකාශනයයි

බටහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ කළුතර කරවන ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ ගවයින් අතර "මුව සහ කුර" නමැති රෝගය පැතිරී යන බැවින්, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන්පත් අබේරත්න බණ්ඩාරනායක වන මම 1957 අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥාපනතේ 327 වැනි පරිච්ඡෙදයේ 4 වැනි වගන්තියේ 1 වැනි අතුරු වගන්තිය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව පහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශය බෝවෙන රෝග ඇති ප්‍රදේශයක් කොට සලකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි.

උතුරට : පානදුර-තොටමූන ; දකුණට : බෙන්තොට-වලල්ලාවිට කෝරළේ ; නැගෙනහිරට : පස්දුන් කෝරළේ බටහිර ; බස්නාහිරට : මුහුද.

2. මෙම ආඥා පනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර, තහනම් කරන ලද, ඉහත සඳහන් සීමා ඇතුළත් ප්‍රදේශයට හෝ ඉන් පිටතට ගවයන් හෝ ගවයන් බඳින ලද වාහන හෝ මෙම දැන්වීම මා විසින් අවලංගු කරන තෙක් ගෙන යෑම තහනම් කරමි.

3. තවද, 1937 දී සම්මත කරන ලද "සතුන්ගේ බෝවෙන රෝග" පළිබඳ නීති මාලාව අනුව තහනම් කරන ලද ප්‍රදේශයක ඒ ඒ නිලධාරීන් විසින් නීත්‍යානුකූලව ක්‍රියා කරන අයුරු ගව හිමියන් හා කරත්තකරුවන් වෙත මෙයින් සිහිපත් කරවන අතර, එම නීතිරීති සම්බන්ධව වැඩි විස්තර කළුතර පශු වෛද්‍ය තැනගෙන් හෝ කළුතර කරවන ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි බව මෙයින් වැඩි දුරටත් දන්වමි.

4. මෙම ප්‍රකාශනය අද දින පටන් වලංගු වන බව දත යුතුයි.

අබේරත්න බණ්ඩාරනායක,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරිතැන.

1962 නොවැම්බර් මස 30 වැනි දින,
පේරාදෙණියේ, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
නිලධාරිගේ කාර්යාලයේ දී ය.

12-130

---

## ප්‍රකාශනයයි

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ පාත දුම්බර කරවන ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ පල්ලේගම්පහ කෝරළයේ පරණගම ගම්පති කොට්ඨාශයේ ගවයින් අතර "මුව සහ කුර" රෝගය පැතිරී යන බැවින්, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන්පත් අබේරත්න බණ්ඩාරනායක වන මම 1957 අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥා පනතේ 327 වැනි පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ 1 වැනි අතුරු වගන්තිය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව පහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශය බෝවෙන රෝග ඇති ප්‍රදේශයක් කොට සලකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි.

උතුරට : මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුවේ උඩගම්පහ කෝරළේ මායිම ; දකුණට : මහවැලි ගඟ ; නැගෙනහිරට : පාත දුම්බර පලිස්පත්තුව බටහිර කෝරළේ මායිම ; බස්නාහිරට : පිඟාඔය.

2. මෙම ආඥා පනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර, තහනම් කරන ලද, ඉහත සඳහන් සීමා ඇතුළත ප්‍රදේශයට හෝ ඉන් පිටතට ගවයන් හෝ ගවයන් බඳිනා ලද වාහන හෝ මෙම දැන්වීම මා විසින් අවලංගු කරන තෙක් ගෙන යෑම තහනම් කරමි.

3. තවද, 1937 දී සම්මත කරන ලද "සතුන්ගේ බෝවෙන රෝග" පිළිබඳ නීති මාලාව අනුව තහනම් කරන ලද ප්‍රදේශයක ඒ ඒ නිලධාරීන් විසින් නීත්‍යානුකූලව ක්‍රියා කරන අයුරු ගව හිමියන් හා කරත්ත කරුවන් වෙත මෙයින් සිහිපත් කරවන අතර, එම නීතිරීති සම්බන්ධව වැඩි විස්තර තෙල්දෙණිය පශු වෛද්‍ය තැනගෙන් හෝ පාතදුම්බර කරවන ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි තැනගේ කාර්‍යාලයෙන් ලබාගත හැකි බව මෙයින් වැඩි දුරටත් දන්වමි.

4. මෙම ප්‍රකාශනය අද දින පටන් වලංගු වන බව දත යුතුයි.

අබේරත්න බණ්ඩාරනායක,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරිතැන.

1962 නොවැම්බර් මස 29 වැනි දින,
පේරාදෙණියේ, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
නිලධාරිගේ කාර්‍යාලයේ දී ය.

12-125/1

---

## ප්‍රකාශනයයි

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ හැරිස්පත්තුව කරවන ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ පල්ලේ ගම්පහ කෝරළයේ මුල්ලේගම සහ කහවත්ත ගම්පති කොට්ඨාශවල ගවයින් අතර "මුව සහ කුර" නැමති රෝගය පැතිරී යන බැවින්, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරී තැන්පත් අබේරත්න බණ්ඩාරනායක වන මම 1957 අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥා පනතේ 327 වැනි පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ 1 වැනි අතුරු වගන්තිය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව පහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශය බෝවෙන රෝග ඇති ප්‍රදේශයක් කොට සලකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි.

උතුරට : මාතලේ දිස්ත්‍රික්කයේ කොහොන්සිය පත්තුවේ සහ කුරුණෑගල දිස්ත්‍රික්කයේ මඳුරේ කෝරළේ මායිම් ; දකුණට : මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තුවේ කුළුගම්මන සිය පත්තුවේ මායිම ; නැගෙනහිරට : මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තුවේ උඩගම්පහ කෝරළේ මායිම සහ පිඟාඔය ; බස්නාහිරට : මහනුවර දිස්ත්‍රික්කයේ ගලසිය පත්තු කෝරළේ සහ මැඳසියපත්තු කෝරළේ මායිම.

2. මෙම ආඥා පනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර තහනම් කරන ලද, ඉහත සඳහන් සීමා ඇතුළත ප්‍රදේශයට හෝ ඉන් පිටතට ගවයන් හෝ ගවයන් බඳිනා ලද වාහන හෝ මෙම දැන්වීම මා විසින් අවලංගු කරන තෙක් ගෙන යෑම තහනම් කරමි.

3. තවද, 1937 දී සම්මත කරන ලද "සතුන්ගේ බෝවෙන රෝග" පිළිබඳ නීති මාලාව අනුව තහනම් කරන ලද ප්‍රදේශයක ඒ ඒ නිලධාරීන් විසින් නීත්‍යානුකූලව ක්‍රියා කරන අයුරු ගව හිමියන් හා කරත්ත කරුවන් වෙත මෙයින් සිහිපත් කරවන අතර, එම නීතිරීති සම්බන්ධව වැඩි විස්තර තෙල්දෙණිය පශු වෛද්‍ය තැනගෙන් හෝ හාරිස්පත්තුව කරවන ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි තැනගේ කාර්‍යාලයෙන් ලබාගත හැකි බව මෙයින් වැඩි දුරටත් දන්වමි.

4. මෙම ප්‍රකාශනය අද දින පටන් වලංගු වන බව දත යුතුයි.

අබේරත්න බණ්ඩාරනායක,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරිතැන.

1962 නොවැම්බර් මස 29 වැනි දින,
පේරාදෙණියේ, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
නිලධාරිගේ කාර්‍යාලයේ දී ය.

11-125/2

---

## රථවාහනවලට අවහිර

### කළුතර දිස්ත්‍රික්කයෙහි, හොරණ-අඟුරුවාතොට තොටුපළෙහි සිට අළුත්ගම දක්වා ඇති පාර

හොරණ-අඟුරුවාතොට තොටුපළෙහි සිට අළුත්ගම දක්වා වැටී ඇති පාරේ අඟුරුවාතොට පාලමෙහි නැවත තට්ටු දැමීම සඳහා මෙම පාලම 62.12.8 වෙනි දින සිට මාස දෙකක කාලයකට සියළුම රථ වාහන සඳහා වසා තබනු ලබන බව සාමාන්‍ය මහජනයාගේ දැන ගැනීම පිණිස මෙයින් නිවේදනය කරමි. මේ වෙනුවට කිරිමැටිය-යාල, කොළඹ-ගාල්ල සහ කටුකුරුන්ද-නෑබොඩ නමැති මාර්ගයන් පාවිච්චි කිරීමට හැකිවනු ලැබේ.

සි. මා. පෙරේරා,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

1962 නොවැම්බර් මස 30 වැනි දින,
රජයේ වැඩ කාර්‍යාලය,
කොළඹ.

12-140

---

## රථවාහනවලට අවහිර

### දකුණු කොළඹ දිස්ත්‍රික්කයේ මහරගම-පිළියන්දල පාරේ අංක 3/7 දරණ බෝක්කුව

මහරගම-පිළියන්දල පාරේ අංක 3/7 දරණ බෝක්කුව 62.12.10 වෙනි දින සිට 63.1.9 වෙනි දින දක්වා සියළුම රථවාහන උදෙසා වසා තබනු ලබන බව සාමාන්‍ය මහජනයාගේ දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

මේ වෙනුවට මොරකැටිය-තුම්බෝවිල මාර්ගය පාවිච්චි කළ හැක.

සි. මා. පෙරේරා,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

1962 නොවැම්බර් මස 30 වැනි දින,
රජයේ වැඩ කාර්‍යාලය,
කොළඹ.

12-141

## ලංකා දුම්රිය සේවය

**දුම්රිය මාර්ගය හරහා මහා මාර්ගය දිවෙන ස්ථාන ප්‍රකෘතිමත් කිරීම.**

ප්‍රධාන දුම්රිය මාර්ගයේ හැටන් සහ රොසැල්ල දුම්රියස්ථාන අතර සැ. 107 දූ. 43 අසලින් දුම්රිය මාර්ගය හරහා කොත්මලේ මහා මාර්ගය වැටී ඇති ස්ථානය ප්‍රකෘතිමත් කිරීම පිණිස ලබන දෙසැම්බර් මස 14 වැනි සිකුරාදා පෙ. ව. 7.0 සිට ප. ව. 4.0 දක්වාත්, 15 වැනි සෙනසුරාදා පෙ. ව. 7.0 සිට රාත්‍රී 9.30 දක්වාත්, 16 වැනි ඉරිදා පෙ. ව. 1.30 සිට ප. ව. 4.0 දක්වාත් රථ වාහන ධාවනය වළකාලීම සඳහා අර්ධ වශයෙන් වසා තබන අතර 15 වැනි සෙනසුරාදා රාත්‍රී 9.30 සිට පසුදා (16 වැනි ඉරිදා) පෙ. ව. 1.30 දක්වා සම්පූර්ණයෙන් වසා තබනු ලැබේ.

අර්ධ වශයෙන් වසා තබන කාලය තුළදී මේ ස්ථානයෙන් රථවාහන ධාවනයට අවකාශ ලැබෙන අතර, සම්පූර්ණයෙන් වසා තබන කාලය තුළදී රථ වාහන ධාවනයට වෙනත් මාර්ගයන් නොමැති බැව් ද සැලකිය යුතුය.

12-99

---

සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).

ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායකමුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායකමුදල් භාරගනු නොලැබේ.

**දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරණු ලබන ගාස්තු**

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරණු ලැබේ)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරණු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සතියේ දවස්වල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද සෙනසුරාදා දවස්වල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද කාර්යාලයේ කටයුතු කරණ කාලය බව සැලකිය යුතුය.

4. සතියේ දවස්වල පස්වරු 3.30ට සහ සෙනසුරාදා දවල් 12ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුවූ සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චැක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත "පිටපත" කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි. ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරණ දැන්වීම් හෝ පළ කරණු නොලැබේ.

9. උසාවියේ අණ පණත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතාගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරණු නො ලැබේ.

10. 1962 ජූලි මස 16 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරණ ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | 10 | 0 |
| වැඩිවන සෑම අඟලට හෝ ඉන් කොටසකට ... ... | 10 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 110 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 220 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරණු ලබන ගාස්තුව අය කරණු ලැබේ.

11. සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).

13. දායක ගාස්තු :—

**ආණ්ඩුවේ ගැසට් පත්‍රය—වාර්ෂික**

| | මෙරට | | පිටරට |
|---|---|---|---|
| | රු. ශ. | | රු. ශ. |
| එක් කොටසක් ... ... ... | 22 50 | ... | 35 50 |
| I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 12 50 | ... | 18 0 |
| I වැනි කොටසේ ඡේද දෙකක් ... ... | 20 0 | ... | 28 0 |

වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නොඅඩු කාලයකට පමණය.

**තනි පිටපත් සඳහා ගාස්තු—(පිටපත් විකිණීමට තිබේ නම්)**

| | මිළ | | තැපැල් ගාස්තු මෙරට |
|---|---|---|---|
| | රු. ශ. | | රු. ශ. |
| (අ) i. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියක් ඇතුලත දී එක කොටසක් ... ... ... | 0 25 | ... | 0 20 |
| ii. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියකට පසු, එක කොටසක් ... ... ... | 0 50 | ... | 0 20 |
| (ආ) i. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියක් ඇතුලත දී, I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 0 10 | ... | 0 15 |
| ii. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියකට පසු, I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 0 20 | ... | 0 15 |

දායක මුදල් බාරගැනීම සහ තනි පිටපත් විකිණීම බාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත මුදල් ලැබෙන්නට සලස්වන්න.

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි